**රාජාංගනය ප්‍රාදේශීය සභාව - 2020**
**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

රාජාංගනය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක .

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.2 නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් ලේඛන අනුව විෂයයන් 02 කට අදාළ බිල්කිරීම් වටිනාකම රු.2,474,555 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.1,012,850 ක් ලෙස රු.1,461,705 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ආදායම් මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ ඉදිකළ තුඹුල්ලේගම අක්කර 50 මාර්ගය කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2020 නොවැම්බර් 08 දින ලබාදුන් රු.909,904 ක අත්තිකාරම පිළිබඳව වත්කම් හා වගකීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | පිළිගනිමි. | නොපියවූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම් ජංගම වත්කම් ලෙස දැක්විය යුතුවේ. |
| (ඇ) | උපලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.6,527,889 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.6,095,441 ක් ලෙස රු.432,448 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද මාර්ග 05 කට අදාළ බෝක්කුවල වටිනාකම රු.2,592,924 ක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | පිළිගනිමි. | ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතුවේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.2,106,092 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරමි. | ශේෂ තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 15,691,980 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,352,148 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබෙන හිඟ කඩකුලී ආදායම රු.634,008 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟකඩ කුලී අයකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | ඉකුත් වර්ෂයේ සිට පැවතඑන රු.220,425 ක හිඟහිටි බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොතිබුණු අතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි දූරකථන කුළුණු 10 කට අදාළව 2020 වර්ෂය වෙනුවෙන් දූරකථන සමාගම් 03 කින් අයවිය යුතු රු.30,000 ක් අයකරගෙන නොතිබුණි. | කේවල ශේෂ සොයා ගැනීමට නොහැකි නිසා අයකර ගැනීමේ අපහසුතාවයක් පවතී. | හිඟ බලපත්‍ර හා දූරකථන කුළුණු ආදායම් අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |

(ඇ) **වෙනත් ආදායම්**

**-------------------**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.6,221,597 ක වෙනත් ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කර ඇත. | වෙනත් ආදායම් අයකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |